# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
# மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
# Ministry of Mahaweli Development and Environment

"සොබාදම් පියස" , අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச" , இல. 416/சீ/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121

ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944


මගේ අංකය / எனது இல / My No: MMDE/06/LR/soil perm/2018

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.11. 15

**පරිසර චක්‍රලේඛ 03/2019**

සියලු ම දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරුන්
සහ ප්‍රාදේශීය ලේකම්වරු

**වාණිජමය නොවන අරමුණින් පස් හා බොරළු කැණීම හා ප්‍රවාහනය**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් 2019.03.12 දින නිකුත් කරන ලද පරිසර චක්‍රලේඛ 01/2019 මෙයින් අවලංගු වන අතර ඒ වෙනුවට 2019.11.20 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඉදිකිරීම් අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී දැනට ක්‍රියාත්මක ක්‍රමවේදයන්හි පවත්නා අඩුපාඩු මග හරවා ගනිමින් විධිමත් හා කාර්යක්ෂම ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම තුලින් මහජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති අපහසුතා හා ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

1. අ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා ඒ හා බැඳුණු කාර්යයන් සඳහා පස් හෝ බොරළු යන ඉදිකිරීම් අමුද්‍රව්‍ය **කියුබ් 35 නොඉක්මවන ප්‍රමාණයන්** තම නීත්‍යානුකූල හිමිකාරිත්වය සහිත ඉඩමින් ඉවත් කිරීමට සිදුවන විට, එම ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හෝ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය නොසලකා ඉඩමට යාබද ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ කියුබ් 2 ක් හෝ එයට අඩු ධාරිතාවයකින් යුත් සුදුසු ප්‍රවාහන ක්‍රමයක් භාවිතා කරමින් පෙ.ව 6.00 සිට ප.ව 6.00 දක්වා කාලය තුළ එම ඉදිකිරීම් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී විසින් ඇමුණුම 1 හි සඳහන් නියමිත ආකෘතියට අනුව නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත සිදු කළ යුතුය.

   ආ ඉහතින් සඳහන් කළ පස් හෝ බොරළු කැණීම, ඉවත් කිරීම සහ ප්‍රවාහනය, පරිසරයට හා ජන ජීවිතයට හානියක් නොවන ආකාරයෙන් සිදු වන බවට හා **එම නිශ්චිත හිමිකාරිත්වයක් සහිත හිමිකරු සතු ඉඩමින් කැණීම හේතුවෙන් කිසිදු ලෙසකින් කියුබ් 35ක් ඉක්මවා ඉදිකිරීම් අමුද්‍රව්‍ය ඉවත් කිරීමක් සිදුනොවන** බවට අදාළ ග්‍රාම නිලධාරී විසින් පෞද්ගලිකවම සහතික විය යුතු අතර නිකුත් කරනු ලබන අවසර පත්‍ර සම්බන්ධයෙන් ලේඛනයක් ග්‍රාම නිලධාරී කාර්යාලයේ පවත්වා ගෙන යා යුතු ය. තවද, නිකුත් කරනු ලබන අවසර පත්‍රයෙහි එක් පිටපතක් ග්‍රාම නිලධාරී විසින් තම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත යොමු කළ යුතුය.

2. මූලික පරමාර්ථය **වාණිජ පදනමින් ඛනිජ කැණීමක් නොවන ක්‍රියාවලියක් හේතුවෙන්** ජනනය වන පස් හෝ බොරළු යන ඉදිකිරීම් අමුද්‍රව්‍ය **කියුබ් 50 නොඉක්මවන ප්‍රමාණයක්** යම් ඉඩමකින් නීති විරෝධී නොවන විශේෂිත කටයුත්තකට ඉවත් කිරීමට සිදුවන විට එම ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර නිර්දේශ සහිත වාර්තාව තම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, ඒ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය/ වයඹ පළාත් පරිසර අධිකාරිය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හා වෙනත් නියමිත ආයතනයන්හි නිර්දේශ ලබා ගත යුතු වේ නම් අදාළ නිර්දේශයන් ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ක්‍රියාකල යුතුය. ඒ අනුව, අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හෝ ඊට යාබද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කියුබ් 2ක් හෝ ඊට අඩු ධාරිතාවයකින් යුත් සුදුසු ප්‍රවාහන ක්‍රමයක් භාවිතා කරමින් පෙ.ව. 6.00 සිට ප.ව. 7.00 දක්වා කාලය තුළ එම ඉදිකිරීම් අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බලපත්‍ර

ලබාදිය යුතුය. ඒ සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී දැනටමත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබාදී ඇති බලපත්‍ර පොත් පමණක් භාවිතා කළ යුතු වේ.

3. අ ඉහත 2 වගන්තියෙහි දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව ඉවත්කරනු ලබන ඉදිකිරීම් අමුද්‍රව්‍ය, අදාල ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට යාබද නොවන වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ප්‍රවාහනය කිරීමට සිදුවන විශේෂිත අවස්ථාවකදී, ඒ සඳහා කැණීම සිදුකරන ලද ඉඩම අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ පෞද්ගලික නිර්දේශය මත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අදාල ප්‍රාදේශීය කාර්යාලය විසින් ප්‍රවාහන බලපත්‍ර නිකුත් කළ යුතුය.

ආ එසේ වුවද, **එම ඉඩමින් කැණීම හේතුවෙන් ජනනය වන ඉදිකිරීම් අමුද්‍රව්‍ය කියුබ් 50ක් ඉක්මවා ඉවත් කිරීමක් සිදු නොවන බවට** බලපත්‍ර නිකුත් කරන බලධාරියා වගබලා ගත යුතු අතර, මෙම පස් හා බොරළු කැණීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් පැන නගින පාරිසරික හා සමාජීය ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය/ වයඹ පළාත් පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හෝ වෙනත් නිශ්චිතව නිර්දේශ ලබා ගතයුතු ආයතන ඇත්නම් එම ආයතනයන්හි අධීක්ෂණයට ලක් කළ යුතුය.
කෙසේ වුවද, ඉහත 1 හා 2 හි සඳහන් බලපත්‍ර මගින් යම් ඉඩමකින් ඉවත් කරන මුලු පස් හෝ බොරළු ප්‍රමාණය කිසිම ආකාරයකින් කියුබ් 50 ඉක්ම නොවිය යුතුයි.

4. ඉහතින් සඳහන් කල පරමාර්ථයන් ඉටු කර ගැනීම සඳහා නිකුත් කරන ලද අවසර පත්‍ර හෝ බලපත්‍ර උපයෝගී කර ගනිමින් කිසිදු අයුරකින් කුඹුරක්, වගුරු බිමක්, රක්ෂිතයක් හෝ පරිසර සංවේදී ස්ථානයක් ගොඩ කිරීම සඳහා පස් හෝ බොරළු යොදා ගැනීම, හෝ අවසරගත යුතු ස්ථානයකට නිසි අවසරයකින් තොරව බැහැර කිරීම නීති විරෝධි ක්‍රියාවන් වන බැවින් එවැනි නීති විරෝධි කාර්යයන් සිදුනොවන බවට වග බලා ගැනීම අවසර පත්‍ර හෝ බලපත්‍ර නිකුත් කරන බලධාරියාගේ පූර්ණ වගකීමකි. තවද, එවන් කාර්යයන් සිදු කිරීමට ඇති ඉඩකඩ ඇහිරීමට අවශ්‍ය සියළු පියවර ගැනීමට අවසර පත්‍ර හෝ බලපත්‍ර නිකුත් කරන බලධාරියා විසින් කටයුතු කළ යුතුවේ.

5. පස් හා බොරළු කැණීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් ලබා දී ඇති බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ එක් එක් බල ප්‍රදේශවල පොලිස් ස්ථාන දැනුවත් කිරීම සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා සියළුම පොලිස් ස්ථානවල සහයෝගය ලබාගැනීමට බලපත්‍ර නිකුත් කරනු ලබන නිලධාරීන් විසින් වගබලා ගත යුතුවේ. විශේෂයෙන් පස් හා බොරළු ප්‍රවාහනයේ දී නියමිත අවසර පත්‍ර හා බලපත්‍ර තිබේදැයි නිරන්තරවම පොලිසිය විසින් පරීක්ෂාවට ලක් කළ යුතුවේ.

මෙම චක්‍රලේඛය ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාව ඇතුව නිකුත් කරන ලද්දකි.

**අනුර දිසානායක**
**ලේකම්**
**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

පිටපත්

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කාරු. දැ. ගැ. ස. |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කාරු. දැ. ගැ. ස. |
| 3. | ලේකම්,රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 4. | ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 5. | සෙසු සියළුම අමාත්‍යාංශ ලේකම්වරු | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 6. | විගණකාධිපති | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 7. | පොලිස්පති, ශ්‍රී ලංකා පොලිසිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 8. | සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 9. | සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |
| 10. | අධ්‍යක්ෂ, වයඹ පළාත් පරිසර අධිකාරිය | - කාරු. දැ. ගැ. ස. හා අ. ක. ස. |